# භාරතීය විවාහය

මෙරට සිටින ප්‍රබුද්ධයන් යැයි කියන අය අද සිංහලයන් වික්ටෝරියානු කුහක සදාචාරයක ගිලී ඇති බව කියමින් පැරණි සිංහල සමාජයේ තිබියේ යැයි කියන සදාචාර සංග්‍රහයට ආපසු යෑමට කතාකරන්නේ පැරණි සිංහලයට ඇති ගෞරවයකින් නොවන බව පෙනී යන්නේ ඔවුන් වෙනත් කිසිම කරුණක දී එවැන්නක් නොකියන බව මෙනෙහි කරන විට ය. අනෙක් කරුණක දී එසේ පැරණි දේ ගැන කතාකිරීම ඔවුන් හඳුන්වන්නේ ඊනියා අතීතකාමයක් ලෙස ය. අප අපේ දැනුමක් නිර්මාණය කිරීමේ දී අපේ සංස්කෘතික පදනම සලකා බැලීම ඔවුහු නුරුස්සති.

එසේ වුවත් බටහිරයන් පහළොස්වැනි සියවසේ දී අළුත් දැනුමක් නිර්මාණයකිරීම සඳහා එක් පැත්තකින් ග්‍රීක දැනුමට හා චින්තනයටත්, අනෙක් පැත්තෙන් යුදෙව් දැනුමට හා චින්තනයටත් ආපසු ගියහ. බටහිර විද්‍යාව ඇතුළු බටහිර අනෙක් දැනුම්වලට ස්වසිද්ධාත්මක ක්‍රමය ග්‍රීකයන්ගෙන් ද වියුක්තය යුදෙව්වන්ගෙන් ද ලැබී ඇති බව පැහැදිලි ය. එහෙත් බටහිරයන්ට අතීතකාමී යැයි කියන්නකු සොයාගත නො හැකි ය. සදාචාරය සම්බන්ධයෙන් ද පැරණි සිංහල සංස්කෘතියෙන් යමක් ලබාගත හැකි නම් එලෙස ලබාගැනීමේ වරදක් නැත. එය අතීතකාමයක් නිසා නොව අපේ ප්‍රවාද ගොඩනගාගැනීමේ දී අපට අපේ චින්තනය අවශ්‍යවීම නිසා කළ යුත්තකි. මෙරට උගතුන් යැයි කියාගන්නා අය තම තමන්ගේ ක්ෂෙත්‍රවල යොදාගන්නා නූතන පාරිභාෂික වචන සැලකිල්ලට ගත්තත් පෙනී යන කරුණක් වනු ඇත්තේ ඒ බොහොමයක් ග්‍රීක ලතින් භාෂා ඇසුරෙන් මෑතක දී නිර්මාණය කරන ලද දෑ බව ය.

ප්‍රබුද්ධයන් යැයි කියන්නන් විවාහය සම්බන්ධයෙන් පමණක් අතීතයට යෑමට වලිකන්නේ අන් හේතුවක් නිසා නොව එමගින් සිංහල සංස්කෘතියට අතීතයේ දී මෙන් ම අනාගතයේදීත් පහර දීමට අවස්ථාව සලසාගැනීමට බව පැහැදිලි ය. මෙරට ඉතිහාසයට හා සංස්කෘතියට විරුද්ධව කරුණු ඉදිරිපත්කරන ඊනියා ප්‍රබුද්ධයන්ගේ උත්සාහය ඔවුන් අතීතයෙහි දී මෙරට තිබිණි යැයි කියන විවාහ සම්ප්‍රදායකට යෑමෙන් වර්තමානයෙහි දී බටහිර විවාහය සම්බන්ධයෙන් ඇති ආකල්ප සිංහලයන්ට අතර ප්‍රචලිතකිරීමට ය.

ඉතිහාසයෙන් පැහැදිලිව ම කියැවෙන දෙය නම් මෙරට පමණක් නොව භාරතයේ ද සමස්තයක් ලෙස ගත්කල ඒක පුරුෂ ඒක භාර්යා විවාහය දිගු කලක් තිස්සේ පැවතී ඇති බව ය. අප කලින් සඳහන්කර ඇති පරිදි භාරතයේ රජවරුන් අන්ත:පුර පවත්වාගෙන ගොස් ඇති නමුත් ඒ සාමාන්‍යය නො වී ය. භාරතයේ බ්‍රාහ්මණ සම්ප්‍රදායෙහි එසේ රජවරුන්ට අන්ත:පුර පවත්වාගෙන යෑමට ඉඩ දී ඇත්තේ එහි තිබූ කුලක්‍රමය අනුව රජවරුන්ට රට පාලනයෙහි මුළුමනින් ම යෙදීමට නියම වූ බැවින් යැයි සිතිය හැකි ය.

මෙහි දී කිවයුතු වැදගත් කරුණක් වෙයි. රජවරුන්ට රට පාලනයකිරීම එකම කටයුත්ත ලෙස නියමකෙරුණේ ආර්ය සංස්කෘතිය හා ආර්ය ශිෂ්ටාචාරය මුළුමනින් ම පිළිගත් භාරතීය සමාජවල හා ගෝත්‍රවල බව ය. එසේ ආර්ය ආධිපත්‍යයට යටනොවූ සමාජවල හා ගෝත්‍රවල එවැනි ශ්‍රම විභේදනයක් ඇති නොවූ බව ශුද්ධෝදන රජු සී සෑම සිද්ධියෙන් පැහැදිලි වෙයි. ගෞතම ගෝත්‍රයට අයත් ශාක්‍ය වංශයෙහි රජවරු (ඇතැම්විට බලවත් නායකයෝ) රජකමට අමතරව ගොවිතැන ද කිරීමට පුරුදු ව සිටියහ. ඒ අනාර්ය (ද්‍රවිඩ යැයි ගම්‍ය නොවන බව පැහැදිලි විය යුතු ය) සිරිත මෙරට රජවරුන්ට ද උරුම ව තිබූ බව ද පැහැදිලි ය. අප රටට කිසිම දවසක පූර්ණ ආර්ය සංස්කෘතික ආක්‍රමණයක් නොවීම අප භාරතයෙන් ස්වාධීන වූ අනන්‍ය සංස්කෘතියක් ගොඩනැගීමට එක් හේතුවක් විය. අප රටට භාරතයෙන් පැමිණියෝ අර්ධ ආර්යයෝ වූහ.

බටහිර ඇතැමුන් අද පුරුෂයන් හා ස්ත්‍රීන් අතර ලිංගික කරුණු සම්බන්ධයෙන් වෙනසක් නැති බව දැක්වීමට උත්සාහ ගනිතත් ඒ එසේ නොවන බව පැහැදිලි ය. සමස්තයක් ලෙස ගතහොත් පිරිමි ගැහැණුන්ට වඩා ලිංගික සම්බන්ධකම්වලට කැමැත්තක් දක්වති. පෙර කල සිට ගණිකා වෘත්තියක් භාරතයේ ද අනෙක් රටවල ද තිබී ඇත්තේ මේ වෙනස හේතුකොටගෙන ය. ගණිකා වෘත්තියෙහි යෙදුණෝ ගැහැණු වූහ. පිරිමින්ට ගණිකා වෘත්තියෙහි යෙදීමට සාමාන්‍යයෙන් අවශ්‍ය නොවුයේ ගැහැණුන්ට පිරිමින්ට මෙන් ලිංගික සම්බන්ධකම් පැවැත්වීමේ අවශ්‍යතාවක් නොවීම නිසා ය.

© Prof. Nalin De Silva

එහෙත් මේ මතයට එකඟ නොවන්නන් සිටිය හැකි ය. විශේෂයෙන් ම පසුගිය දශක කිහිපයක බටහිර මතවාද දැනගත් එහෙත් ඉතාම මෑත මතවාද නොදත් අය ගැහැණුන් හා පිරිමින් අතර ඊනියා සමානත්වයක් ගැන සඳහන්කරමින් ප්‍රකාශකරනු ඇත්තේ ගැහැණුන්ට ද සමස්තයක් ලෙස ගත්කල පිරිමින්ට මෙන් ම ලිංගික අවශ්‍යතා ඇති නමුත් සමාජය විසින් ගැහැණුන්ට නිදහසේ ලිංගිකව හැසිරීමට තහංචි පනවනු ලැබ ඇති බැවින් ගණිකා වෘත්තියෙහි යෙදෙන පිරිමින් අවශ්‍ය නොවූ බව ය. එහෙත් මේ මුළුමනින් ම වැරදි මතයකි. ගැහැණු හා පිරිමි ලිංගික අවශ්‍යතා සම්බන්ධයෙන් වුව ද සමස්තයක් ලෙස ගැනීමේ දී වෙනස් වෙයි. ඒ බව දැන් දැන් බටහිර ජීව විද්‍යාංයන්ට ද නිරීක්‍ෂණවලින් නිරීක්‍ෂණවලින් පසක්වෙමින් පවතියි.

දැන් අපි රජවරුන්ගේ කල්ක්‍රියාව ගැන නැවතත් අපේ අවධානය යොමුකරමු. ආර්ය ශිෂ්ටාචාරයෙහි රජවරුන් වූ ක්‍ෂත්‍රියයන්ගේ කාර්යභාරය වූයේ රට ආරක්‍ෂාකිරීම සහ පාලනයකිරීම ය. එය පූර්ණකාලීන කටයුත්තක් විය. එහි දී ඔවුන්ගේ සිත වෙනතක ඇදී යෑම වැළැක්වීම රටෙහි යහපතට ම හේතුවිය. ඔවුන්ගේ කාලයෙන් කොටසක් හෝ වෙනත් කටයුත්තක් වෙනුවෙන් යෙදීම රටට අහිතකර යැයි බ්‍රාහ්මණයන් සිතන්නට ඇත. එබැවින් රජවරුන් සඳහා අන්තඃපුර ඇතිකිරීමට බ්‍රාහ්මණයන් අවසර දෙන්නට ඇතැයි සිතිය හැකි ය.

රජවරුන් සම්බන්ධයෙන් එසේ අන්තඃපුර පවත්වාගෙන යෑමට ඉඩදුන් භාරතයෙහි සාමාන්‍ය මිනිසුන් සම්බන්ධයෙන් කිනම් මාර්ගයක් අනුගමනය කෙරෙන්නට ඇත් ද? මෙහි දී බොහෝ උගතුන්ගේ අදහස නම් කාමසූත්‍රය වැනි කෘති මගින් බ්‍රාහ්මණයන් කර ඇත්තේ ලිංගික කාර්යන් සඳහා විශේෂයෙන් ම පිරිමින්ට ඒ අවශ්‍ය උපදෙස් ලබාදීම ය. පිරිමින්ට විවිධ ගැහැණුන් සමග ලිංගිකව හැසිරීම සඳහා අවශ්‍ය කරුණු එහි අඩංගු වෙයැයි උගත්තු පවසති.

එහෙත් මෙ කතාව හෙවත් ප්‍රවාදය බිඳ දැමීමට එතරම් උත්සාහයක් ගතයුතු නො වෙයි. කාම සූත්‍රය ලිවීමට වෙනත් හේතු ඇතැයි සිතිය හැකි ය. එදා භාරතයේ විසූ සාමාන්‍ය ජනයා සමස්තයක් ලෙස ගත්කල අද බටහිර වාසයකරන සාමාන්‍ය මිනිසුන් සමග සංසන්දනයකිරීම වැරදි ය. ඒ ඒ ජන කොටස් විවිධ සංස්කෘතීන්ට, විවිධ චින්තනවලට අයත්වූහ. භාරතය කෘෂිකර්මික සමාජයක් වූවා පමණක් නොව, සමාජයීය වශයෙන් සාමූහිකත්වය බලපැවැත්වූවක් විය. එහෙත් වත්මන් බටහිර එසේ නො වෙයි. එහි රජයන්නේ පෞද්ගලිකත්වය ය. එය අද කාර්මික සමාජයකින් ඊනියා තොරතුරු සමාජයක් බවට පරිවර්තනය වෙමින් පවතියි.

බටහිර සමාජයේ පැවැත්ම ම පුද්ගල ඉන්ද්‍රිය පිනවීම මත රඳා පවතියි. එහි පුද්ගලයන්ට ඉන්ද්‍රිය පිනවීමට අවස්ථා හැකිතාක් නිර්මාණයකිරීම අවශ්‍ය වෙයි. ලිංගික කටයුතු වඩාත්ම ඉන්ද්‍රිය පිනවීමේ කාර්ය වෙයි. එබැවින් බටහිර කාම සූත්‍ර වැනි කෘතියක් නිර්මාණය වුවහොත් ඒ කෙරෙනු ඇත්තේ විශේෂයෙන් ම පිරිමින්ගේ ලිංගික අවශ්‍යතා උද්දීපනය වන ආකාරයට හා ඒ සඳහා විවිධ අවස්ථා ලබාදෙන ආකාරයකට ය. බටහිර ධනපති ක්‍රමය ඇතිවීමට ප්‍රධාන හේතුව වූයේ ද පුද්ගල ඉන්ද්‍රිය පිනවීමට සුදුසු ක්‍රමයක් ඇතිකරගැනීමේ අවශ්‍යතාව ය.

එහෙත් භාරතය එසේ නො වී ය. ආර්ය ආක්‍රමණය යටතේ ද පුද්ගලික ඉන්ද්‍රිය පිනවීම යන්න සමාජයෙහි ප්‍රධාන බලවේගයක් නො වී ය. සමාජයේ සාමූහිකත්වය වෙනස් නො වී ය. එවැනි සමාජයක පෞද්ගලික ඉන්ද්‍රිය පිනවීම සඳහා කෘතියක් බිහිවේ යැයි බලාපොරොත්තු නොවිය හැකි ය. එසේ නම් භාරතයෙහි කාම සූත්‍රයක් බිහිවූයේ ඇයි? එයට හේතුව ලෙස දැක්විය හැක්කේ පිරිමින්ගේ ලිංගිකත්වය තරමක් හෝ මෙල්ලකිරීම ය. පිරිමින් තම ඒක භාර්යා විවාහ කඩාකප්පල් නොකරගනිමින් එකම කුටුම්බයක තම ලිංගික අවශ්‍යතා සම්පූර්ණකරගන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරක් කාම සූත්‍රය කෘතියෙහි සඳහන් වෙයි. බටහිරයන් මේ වැදගත් කරුණ අවබෝධකරගත් බවක් පෙනෙන්නට නැත. එයට හේතුව ඔවුන් පැරණි භාරතය දෙස ඔවුන්ගේ ඇසින් බැලීම ය.

භාරතයේ සාමාන්‍ය ජනයාට බ්‍රාහ්මණයන් ඒක භාර්යා ඒක පුරුෂ විවාහය නියමකර තිබූ බව පැහැදිලි ය. සාමාන්‍යයෙන් භාරතීය සාහිත්‍යයෙහි සඳහන්වන්නේ පිරිමියකුගේ භාර්යාව ගැන හෝ ගැහැණියකගේ ස්වාමිපුරුෂයකු ගැන ය. එසේ නොවන ලිංගික කාර්යයක් ගැන සඳහන් වෙතොත් ඒ රජවරුන්ගේ අන්තඃපුර සම්බන්ධයෙනි. එසේත් නැත්නම් නගරශෝභිණියන් සම්බන්ධයෙනි. එහෙත් බටහිර සමාජය ගණිකාවන්ට සලකන අන්දමට නොව භාරතය

© Prof. Nalin De Silva

නගරශෝභිනියන්ට උසස් ලෙස සලකා ඇත. පැරණි භාරතයේත් නොතිබුණු ලිංගික නිදහසක් මෙරට තිබිණි යැයි උපකල්පනය කිරීම හුදෙක් වත්මන් බටහිර සදාචාර සංග්‍රහය මෙරට ප්‍රචලිතකිරීම සඳහා කෙරෙන්නක් පමණ ය.

අප රටෙහි වූයේ ඉන්ද්‍රිය පිනවීමට මුල්තැනක් නොදුන් සමාජයකි. ඉන්ද්‍රිය පිනවීම හෝ ඉන්ද්‍රිය තැවීම අන්තයකට ගෙනයෑම අපේ ප්‍රතිපත්තියක් නො වී ය. එහෙත් ඒක භාර්යා ඒක පුරුෂ විවාහය මරණය තෙක් කෙසේ හෝ පවත්වාගෙන යා යුතු ය වැනි දැඩි නීති ද මෙරට නො වී ය. එක් අයකුගේ මරණයෙන් පමණක් කෙළවර වියහැකි විවාහ තිබුණේ බටහිර කතෝලික සමාජයෙහි ය. බටහිර කතෝලික පූජකවරු දැඩි ආයාසයකින් බ්‍රහ්මචර්යාව රැකීමට පොරොන්දු වූහ. ඔවුන්ට විවාහ ජීවිතයක් නොවිණ. මේ ආකල්ප එතරම් ම දැඩි ව නොවුණ ද, බටහිර පූජක නොවන සමාජයට ද ඇතුල්කර තිබුණි.

කතෝලික සමාජයෙහි තිබූ ආකල්ප අනුව ලෝකයේ සෑම දෙයක් ම නිර්මාණයක් විය. නිර්මාණයෙහි කෙළවර සිටියේ දෙවියන් වහන්සේ ය. විවාහයෙහි ද නිර්මාපකයා දෙවියන් වහන්සේ විය. උන්වහන්සේ ගේ නිර්මාණයක් අප කඩන්නේ කෙසේ ද? දෙවියන් වහන්සේගේ නිර්මාණය කැඩිය හැකි වූයේ දෙවියන් වහන්සේට පමණ ය. බටහිර විද්‍යාවේ ශක්ති සංස්ථිති නියමයේ ද පදනම එය ය. දෙවියන් වහන්සේගේ නිර්මාණ විනාශකිරීමට කිසිවකුට නො හැකි ය. එමෙන් ම උන්වහන්සේගේ නිර්මාණයට අපට ඉඳහිට හෝ හවුල්විය නො හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva